# රණවිරු ඇපරල් - ශ්‍රී ලංකා යුද හමුදා ඇඟළුම් කර්මාන්තශාලාව
# 2022/2023 වර්ෂය සඳහා භාණ්ඩ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම

1. 2022/2023 වර්ෂය තුල රණවිරු ඇපරල් ඇගලුම් කර්මාන්තශාලාව වෙත භාණ්ඩ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිම සඳහා සැපයුම්කරුවන් වෙතින් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

| **කාණ්ඩය** | **භාණ්ඩ** |
|---|---|
| අ. | ඇගලුම් අමු ද්‍රව්‍ය (බොත්තම්, ස්නැප් බටන් සිල්වර් කළර් සහ ප්ලාස්ටික් .ෆියුසින්, ෂිපර්ස්, අයිලටිස්, සිල්වර් හුක්, රිබන්, මේන් ලේබල්, සයිස් ලේබල්, වෙල්ක්‍රෝ, වෙල්බෝන්, ටැල්ක් ෂීට්, ඉලාස්ටික්, වටකුරු සහ සමතල ඉලාස්ටික්, ට්‍රවිල් ටේප්, වේස්ට් කෝඩ් හා කෝඩ් ස්ටෝපර් ආදිය) |
| ආ | රෙදිපිළි (වියන ලද හා ගොතන ලද) ට්විල්, ට්‍රයිකෝට්, සිංගල් ජර්සි, වෙට්ලුක්, පෝලෝ ක්නිටඩ් (පීකේ), පොලියෙස්ටර්, පොකට්න් රෙදි, පිජාමා රෙදි .විස්කෝස්, පොප්ලින්, මදුරු දැල් රෙදි, පොලිප්‍රොපර්ලින් රෙදි ආදිය) |
| ඇ | රෙක්සින් මැටීරියල්ස්/ඩයරි ක්ලෝත්, ස්පොන්ජ් ෂීට්, පුංචෝ කේප් අමු ද්‍රව්‍ය ආදිය. |
| ඈ. | නූල් |
| ඉ. | ඇසුරුම් ද්‍රව්‍ය (පොලි බෑග්,ගම් ටේප්,සෙලෝ ටේප්,ලේබල් රෝල්) |
| ඊ. | ඉදි කටු සහ ක්ෂය වන ද්‍රව්‍ය (මාකර් පේපර්, ප්ලොටර් පේපර්, බ්‍රිස්ටල් බෝඩ්, බොක්ස් බොඩ්, තිර මුද්‍රණ තීන්ත, ඉන්ක් රෝල්) |
| උ. | කර්මාන්තශාලා මහන මැෂින්/අමතර කොටස්. |
| ඌ. | නිමි ඇඳුම් සඳහා එම්බ්‍රොයිඩර් හා මුද්‍රණ කටයුතු. |
| එ. | කර්මාන්තශාලා සහ කාර්යාල ලිපි ද්‍රව්‍ය. |
| ඒ. | ඇගළුම් කර්මාන්තය හා සම්බන්ධ ලී බඩු සහ කාර්යාල උපකරණ. |
| ඔ. | ඉදිකිරිම් සහ අලුත්වැඩියාවන් සඳහා අවශ්‍ය දැව සහ අනෙකුත් ගොඩනැගිලි ද්‍රව්‍ය. |
| ඕ. | ඇළුමිනියම් භාවිතයෙන් කාර්යාල කොටස් වෙන්කිරිම (ඇළුමිනියම් පාර්ටිෂන්). |
| ක. | මුද්‍රණ කටයුතු (පොත් ආකෘති පත් සහ ස්ටිකර් ආදිය) |
| ඛ. | වායුසමිකරණ යන්ත්‍ර , පරිගණක, පරිගණක උපාංග, ජායා පිටපත් යන්ත්‍ර සහ පරිගණක මුද්‍රණ යන්ත්‍ර අමතර කොටස්, ටෝනර් ආදිය |
| ග. | සියළුම සේවා හා අලුත්වැඩියා කිරිම ( මහන මැෂින් , වායුසමිකරණ යන්ත්‍ර, පරිගණක, ජායා පිටපත් යන්ත්‍ර සහ පරිගණක මුද්‍රණ යන්ත්‍ර). |
| ඝ. | පවිත්‍රතා ද්‍රව්‍ය |
| ඞ. | පිහිණුම් තටාක සඳහා අවශ්‍ය සියළුම උපකරණ හා රසායනික ද්‍රව්‍ය. |
| ච. | මුහුණු ආවරණ සහ ආරක්ෂිත ඇඳුම් කට්ටල සඳහා අවශ්‍ය සියළුම උපකරණ හා රසායනික ද්‍රව්‍ය.(වයර්, පොලිතින්, විශබීජනාශක ද්‍රව්‍ය) |

2 අයදුම් කරනු ලබන සැපයුම්කරුවන් 2022 වර්ෂය වෙනුවෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ හෝ දුරකථන නාමාවලිය කහ පැහැති (යෙලෝ පේජස්) හෝ දුරකථන නාමාවලිය දේදුනු පැහැති (රේන්බෝ පේජස්) හි ලියාපදිංචි වී සිටිය යුතු වේ.

3. ශ්‍රී ලංකා රුපියල් මගින් පමණක් මිලගණන් ඉදිරිපත් කළ යුතු අතර, ගෙවීම් කටයුතු රණවිරු ඇපරල් ආයතනය වෙතින් සිදුකරනු ඇත.

4. රු:500.000.00 ට වැඩි මිළදී ගැනීම් වෙනුවෙන් 2006 රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතෙහි (භාණ්ඩ, වැඩ හා සේවා) දක්වා ඇති පරිදි ලංසු ඇපකර ඉදිරිපත් කිරිම අනිවාර්ය වන අතර, දේශීය නිෂ්පාදනකරුවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ඇත.

5. වැට් බද්ද (VAT) සඳහා ලියාපදිංචි වී ඇත්නම් දේශීය ආදායම් බදු දෙපාර්තුමේන්තු කොමසාරිස් ජෙනරාල් වෙතින් ලබාගත් එම සහතිකය සමග වැට් සක්‍රිය ලිපියේ පිටපතක් (VAT Active Letter) සහ ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් ඇමුණුම් වශයෙන් ඉදිරිපත් කළ යුතුය.

6. තෝරා ගනු ලබන සැපයුම්කරුවන් 2022.05.31 දින සිට 2023.06.01 දින දක්වා කාලය වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන මිල ගනන් යටතේ භාණ්ඩ ලබාදිම සඳහා කටයුතු කළයුතු අතර යුද්ධ හමුදාව වෙතින් ලබා දෙනු ලබන පිරිවිතරයන්ට අනුව නියදියන් ලබා දීම අනිවාර්යය වේ.

7. අදාළ අයදුම්පත හා ලියකියවිලි,එක් එක් කාණ්ඩයන් සඳහා රු: 1000/-ක මුදලක් ගෙවා ගණකාධිකාර, රණවිරු ඇපරල්, ඩේවිඩ් මෙරික් පීරිස් මාවත, කිරිදිවැල පාර, යක්කල වෙතින් සතියේ වැඩකරන දිනයන්හි පෙ.ව. 08.30 සිට ප.ව. 04.30 දක්වා 2022 මාර්තු මස 09 දින දක්වා ලබාගත හැකිය.

8. තැපෑලෙන් අයදුම්පත් ලබාගැනීම රණවිරු ඇපරල් නමින් ලියන ලද "ආදායකයාගේ ගිණුමට පමණයි" ප්‍රේශණපතක් ඉදිරිපත් කිරිමෙන් ලබාගත හැක.

9. සියලුම අයදුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් හෝ රණවිරු ඇපරල් යක්කල කර්මාන්තශාලා පරිශ්‍රයෙහි ඇති සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමේ අයදුම්පත් පෙට්ටිය වෙත බහාලිය යුතු අතර, අයදුම්පත් විවෘත කිරිම 2022.03.10 දින ප.ව. 0200 පැයට සිදු කරන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

10. අයදුම්පත් එහි සඳහන් කරුණු මත ඇගයීමකට ලක්කරනු ලැබේ.

11. වැඩි විස්තර සඳහා රණවිරු ඇපරල් සේනාවිධායක අමතන්න.(දුරකථන ඇමතුම් 033-2224031, 033-2234795 , 033-3340150 ෆැක්ස් 033-2234430 ඊමේල් rvapl.purchasing@gmail.com/rvacsd@gmail.com,වෙබ්:www.army.lk/ranaviruapparel )

**සේනාවිධායක.**
රණවිරු ඇපරල්
ඩේවිඩ් මෙරික් පීරිස් මාවත
කිරිදිවැල පාර.
යක්කල.